④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1377/13 - 2005 ජනවාරි 28 වැනි සිකුරාදා - 2005.01.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

1979.08.06 වැනි දින අංක 48/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් ලෙසින් සංශෝධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමිය නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

ඩබ්ලිව්. ජේ. එස්. කරුණාරත්න,
ජනාධිපති ලේකම්.

2005 ජනවාරි මස 26 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

1. ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 5 වැනි ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලැබේ.

5 (අ) අමාත්‍යාංශ ලේකම්වරයෙකු, තම පාලනය ඉක්මවා යන හේතූන් මත, ඔහු කලින් නියුක්තව සිටි සේවයට නැතහොත් තනතුරට ආපසු යැවෙන අවස්ථාවන්හිදී, ඔහු ලේකම් තනතුරට පත් කිරීමට පෙර අයත්ව සිටි සේවයේ හෝ දරනු ලැබූ තනතුරේ රැඳී සිටින්නේ නම් ඔහුට හිමි විය යුතුව තිබූ ජ්‍යෙෂ්ඨත්වය, අමාත්‍යාංශයක ලේකම් වශයෙන් ඔහු ලැබූ වැටුප් පරිමාණයද සමග ඔහුට පෞද්ගලික වන සේ හිමිවිය යුත්තේ ය.

(ආ) ඉහත 5(අ) අනු ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදනයන් 2004 අප්‍රේල් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02-390